# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல. / My Ref. } CSS/03/01/පොදු-covid19/2020 ඔබේ අංකය / உனது இல / Your Ref. } දිනය / திகதி / Date } 2021.08.25

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස්/මුදල්/ඉංජිනේරු සේවා/සැලසුම්),
ලේකම් (ප්‍රධාන/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර/ක්‍රීඩා) අමාත්‍යාංශය,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්.
දකුණු පළාත.

**කොවිඩ් කාලසීමාව තුළ රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම.**

කොවිඩ් සංචරණ සීමා පවතින කාල පරිච්ඡේදය තුළ සියළුම රාජ්‍ය ආයතන වල කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම හා මහජන සේවා අඛණ්ඩව සලසා දීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට මාගේ අංක CSS/03/01/පොදු/covid-19/2020 හා 2021.08.16 ලිපියෙන් උපදෙස් ලබා දෙන ලදී.

02. එසේ වුවත්, ඇතැම් මාණ්ඩලික නිලධාරීන් සහ දුරකථන දීමනා ලබන නිලධාරීන් තම රාජකාරි දුරකථනයට හා ජංගම දුරකථනයට ඇතැම් අවස්ථාවල නිසි පරිදි ප්‍රතිචාර නොදක්වන බව මා හට නිරීක්ෂණය වී ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2011 හි 03 (ix) උප වගන්තිය ප්‍රකාරව තම ජංගම දුරකථනය හා රාජකාරි දුරකථනය සක්‍රීයව තබා ගැනීමටත් ප්‍රතිචාර දැක්වීමටත් බැඳී සිටින බැවින් ඔබගේ යටත් ආයතන හා කාර්යය මණ්ඩලය දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර, හදිසි අවස්ථාවල සාධාරණ හේතුවකින් තොරව ප්‍රතිචාර නොදක්වන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවද කාරුණිකව දන්වා සිටිමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office } 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax } 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail } chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site } www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"